මගේ අංකය:-05/02/1/10
2006 නොවැම්බර් මස 29 දින

සංවර්ධන රෙගුලාසි චක්‍රලේඛ අංක: 17

නගරාධිපතිනි, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව
නගරාධිපති, මොරටුව මහ නගර සභාව.
සභාපති, පානදුර නගර සභාව.
සභාපති, කැස්බෑව නගර සභාව
සභාපති, බොරලැස්ගමුව ,නගර සභාව
සභාපති, පානදුර, ප්‍රාදේශීය සභාව.
සභාපති, බණ්ඩාරගම, ප්‍රාදේශිය සභාව,
සභාපති, කළුතර ප්‍රදේශිය සභාව.

මහත්මයාණෙනි / මහත්මියණි,

**බොල්ගොඩ ගඟ ආශ්‍රිතව සිදුකරන ඉඩම් අනුබෙදුම් අනුමත කිරීම සහ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළයුතු විශේෂ උපදෙස්**

---

පාරිසරික සංවේදී මෙම කලාපය තුළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු බැවින් සංවර්ධන අයදුම්පත් අනුමත කිරීමේදී හා බලපත්‍ර ලබාදීමේදී පහත දක්වා ඇති කරුණුවලට අනුකූලව කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

- බොල්ගොඩ ගඟ ඉවුරු මායිමේ සිට අඩි 40 ක බිම් තීරයක් ගඟ රක්ෂිතය ලෙස ඉදිකිරීම්වලින් තොරව නඩත්තු කළයුතු අතර, පවතින ස්වභාවික වෘක්ෂලතා ආරක්ෂා කළයුතුය. ඉඩම් අනුමත කිරීමේදී මෙම අඩි 40 ක රක්ෂිත මායිම අදල මානක සැලැස්මේ ලකුණු කර සටහන් කළයුතුය.

- ගඟ ඉවුරට මුහුණලා පිහිටි මායිම සඳහා මායිම් තාප්ප ඉදිකිරිමට අවසර නොදෙන අතර, ඒ සඳහා කම්බි දැල් වැටක් හෝ එවැනි නිමාවකින් යුත් වැටක් සඳහා අවසර දෙනු ලැබේ. එහි උපරිම උස මීටර් 2 නොඉක්මවිය යුතුය.

- ගඟ ඉවුරේ සිට අඩි 40 - 120 ත් අතර සිදු කරනු ලබන පහත දැක්වෙන සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අනුබෙදුම් හෝ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරියෙන් පූර්ව සැලසුම් නිරාකරණයක් ලබාගෙන තිබිය යුතුය.

- අක්කර එකට (01) වැඩි ඉඩම් අනුබෙදුම් කිරීම සඳහා වන අයදුම්පත්
- සියළුම කර්මාන්ත සඳහා වන අයදුම්පත්
- කුඹුරු හා පහත්බිම් සංවර්ධනය කිරීම සඳහා වන අයදුම්පත්
- සංචාරක කර්මාන්තය සඳහා වන අයදුම්පත්
- වර්ග අඩි 3000 ඉක්මවනු ලබන නේවාසික හා වෙනත් ගොඩනැගිලි අයදුම්පත්

♣ ගහ ඉවුරේ සිට අඩි 40 - 120 ත් අතර සීමාව තුළ අවසර දෙනු ලබන බිම් කට්ටිවල භූමි ප්‍රමාණයන් හා ගොඩනැගිලි උස පහත අයුරින් විය යුතුයි.

*ගොඩනැගිලි උස*

| ඉවුරු මායිමේ සිට | ගොඩනැගිල්ලේ උපරිම උස පිහිටි පොළවේ සිට |
|---|---|
| අඩි 40 දක්වා | අවසර දෙනු නොලැබේ |
| අඩි 40 - 80 දක්වා | මෙම සීමාව තුල පවත්වා ගෙන යා හැකි උස මට්ටම් 2 කි. එනම්<br>1. උස අඩි 17 - ගහ රක්ෂිතය තමාගේ ඉඩමේන් වෙන් කරනු ලබන අවස්ථාවන්හිදී රක්ෂිතයෙන් බාහිර කොටසෙහි සිදුකෙරෙන ඉදිකිරීම් සඳහා අනෙකුත් රෙගුලාසි හා අවශ්‍යතාවයන් සම්පූර්ණ වේ නම්, විවෘත අවකාශය නැබීම පිළිබඳව අවම සීමාවන් බල නොපානු ඇත.<br>2. උස අඩි 27 - ගොඩනැගිලි රෙගුලාසි හා අනිකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර, ගහට සමාන්තරව දිවෙන ඉඩම් මායිමේ පළලින් 1/3 ක ප්‍රමාණයක් දෙවෙනි බිම් කට්ටිය සඳහා බොල්ගොඩ ගහේ දර්ශනය අවහිර නොවන ආකාරයට ඉඩමේ එක් පසෙකින් ඉඩ තබා ඉදිකරන්නේ නම්, අඩි 27 ක් උසට ඉදිකිරීම සඳහා අවසර දෙනු ලැබේ. * - |
| අඩි 80 - 120 දක්වා | අඩි 27 |
| අඩි 120 ට වැඩි | නාගරික සංවර්ධන අධිකාරියේ සාමාන්‍ය රෙගුලාසි බලපැවැත්වේ. |

* මෙම අවස්ථාවලදී අදල ස්ථානයේ භෞතික පිහිටීම සැලකිල්ලට ගෙන උස මට්ටම පාලනය කිරීමේ හැකියාව සැලසුම් කමිටුව සතුවේ.

***බිම් කට්ටිවල භූමි ප්‍රමාණය***

| බිම් කට්ටිය | අවම භූමි ප්‍රමාණය (පර්චස්) |
|---|---|
| ගහට මුහුණලා පිහිටි පළමු සහ දෙවන බිම් කට්ටි | 15 |
| ගහට මුහුණලා පිහිටි තෙවන බිම් කට්ටිය | 10 |
| අනෙකුත් බිම් කට්ටිය සඳහා | අදල පළාත් පාලන ආයතනයේ රෙගුලාසි වලට අනුව කටයුතු කළයුතුය. |

- කැලි කසල සහ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අදාළ පළාත් පාලන ආයතනයේ නිර්දේශයන්ට අනුව විධිමත් ක්‍රියා පද්ධතියක් අනුගමනය කළයුතු අතර, ඒවා කිසිසේත්ම ගඟට හෝ ගඟ රක්ෂිතයට බැහැර කිරීම නොකළ යුතුය.

- භූමිය තුළ පස් කැපීමක් හෝ පිරවීමක් සිදු නොකළ යුතු අතර, පවත්නා භූවිෂමතාවයන්ට අනුකූලව ගොඩනැගිලි සැලසුම් කළයුතුය.

- භූමිය තුළ සිදුවන සියළු සංවර්ධන කාර්යයන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් රෙගුලාසිවලට අනුකූල විය යුතුය.

- ගඟ ඉවුරේ සිට අඩි 40 - 120 අතර සිදු කරනු ලබන වර්ග අඩි 3000 ට අඩු නේවාසික සංවර්ධනයන් හැර අනිකුත් සියළු සංවර්ධන කාර්යයන් සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් නිරවුල් සහතිකයක් ලබාගත යුතුය.

මෙයට - විශ්වාසී,

**කේ.වී.ධර්මසිරි**
අධ්‍යක්ෂ ජනරාල්
නාගරික සංවර්ධන අධිකාරිය

බස්නාහිර ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය
மேற்குப் பிராந்திய அபிவிருத்தி அமைச்சு
MINISTRY OF WESTERN REGION DEVELOPMENT

නාගරික සංවර්ධන අධිකාරිය
நகர அபிவிருத்தி அதிகாரசபை
Urban Development Authority

දුරකථන / தொலைபேசி / Telephone: 875916 875917 875918 873652 875919 875920 873644 875333 873647 873649 873651
ෆැක්ස් / பெக்ஸ் / Fax: 873637

6 හා 7 වැනි මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල
6.7 ஆம் மாடிகள். "செத்சிறிபாய", பத்தரமுல்ல
6 & 7 Floors, Sethsiripaya. Battaramulla.

මගේ අංකය:-05/05/10/03/1-16

2002 අගෝස්තු මස 07 දින.

ලේකම්, ප්‍රාදේශීය සභාව, බණ්ඩාරගම.

ලේකම්, පානදුර ප්‍රාදේශීය සභාව, වාද්දුව.

ලේකම්, ප්‍රාදේශීය සභාව, කළුතර.

## බොල්ගොඩ ජලාශය ආශ්‍රිත පෝෂක ප්‍රදේශ සඳහා විශේෂ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

2002 ජූනි 07 දිනැති අංක 1239/27 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් පානදුර, කළුතර හා බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවල උක්ත කලාපය, නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබේ. (මේ පිළිබඳව අදාළ ගැසට් නිවේදන ඔබ ආයතනය වෙත දැනටමත් ලබාදී ඇත.)

02. මෙම කලාපය තුළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පාරිසරික සංවේදනය කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වන බැවින්, සංවර්ධන අයදුම්පත් අනුමත කිරීමේදී පහත දක්වා ඇති විශේෂ රෙගුලාසිවලට අනුකූලව, අනුමැතිය දීමට කටයුතු කරන ලෙසට උපදෙස් දෙමි.

2.1 බොල්ගොඩ ගඟේ ඉවුරු මායිමේ සිට අවම වශයෙන් අඩි 40 ක රක්ෂිතයක් නඩත්තු කිරීම.

2.2 ගඟ ආශ්‍රිත ඉඩම් අනුබෙදීම්දී, අදාළ මානක සැලසුමේ, ඉහත ගඟ රක්ෂිතය සලකුණු කළ යුතු වන අතර, එම සීමාව අතහැරීමෙන් පසුව එකී රක්ෂිතයට මායිම්ව ඇති පළමු හා දෙවන බිම් කොටස්, අවම වශයෙන් පර්චස් 15 ක් විය යුතු වේ.

2.3 බොල්ගොඩ ගඟ රක්ෂිතයට යාබද, පළමු හා දෙවන බිම් කට්ටිවල සියළු ඉදිකිරීම්වල උපරිම උස අඩි 17 කි.

2.4 2002 ජූනි 06 දිනට පෙර, නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ හැර, අනෙකුත් සියළු ප්‍රදේශයන්හි, බිම් කට්ටියක අවම ප්‍රමාණය පර්චස් 10 ක් විය යුතුය.

03. ඉහත රෙගුලාසිවලට අමතරව පහත දැක්වෙන සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය දීමට පෙර එම අයදුම්පත්‍රයේ, මෙම අධිකාරියේ අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) වෙත යොමු කර නිර්දේශය ලබාගන්නා ලෙස දන්වා සිටිමි.

1.1 හෙක්ටයාර් එකට වැඩි ඉඩම් අනුබෙදීම් කිරීම සඳහා වන අයදුම්පත්
1.2 සියළුම කර්මාන්ත සඳහා වන අයදුම්පත්
3.3 බොල්ගොඩ ගඟට මායිම් වන සියලුම සංවර්ධන කටයුතු සඳහා වන අයදුම්පත්
3.4 කුඹුරු හා පහත් බිම් සංවර්ධනය කිරීම සඳහා වන අයදුම්පත්
3.5 සංචාරක ව්‍යාපාරවලට අදාළ සියලු අයදුම්පත්
3.6 පස් කැපීම සඳහා වන සියලු අයදුම්පත්

ජේ.එම්.එල්.ජයසේකර
අධ්‍යක්ෂ ජනරාල්
නාගරික සංවර්ධන අධිකාරිය

බස්නාහිර ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය
மேற்குப் பிராந்திய அபிவிருத்தி அமைச்சு
MINISTRY OF WESTERN REGION DEVELOPMENT

නාගරික සංවර්ධන අධිකාරිය
நகர அபிவிருத்தி அதிகாரசபை
**Urban Development Authority**

දුරකථන / தொலைபேசி / Telephone: 875916 875917 875918 873652 875919 875920 873644 875333 873647 873649 873651
ෆැක්ස් / பெக்ஸ் / Fax: 873637

6 හා 7 වැනි මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල
6,7 ஆம் மாடிகள், "செத்சிறிபாய", பத்தரமுல்ல
6 & 7 Floors, Sethsiripaya, Battaramulla.

පානදුර ප්‍රාදේශීය සභාව
3 -10- 2002
කෙසෙල්වත්ත උප කාර්යාලය

මගේ අංකය:-05/05/10/03/1-16

2002 සැප්තැම්බර් මස 30 දින.

ලේකම්, ප්‍රාදේශීය සභාව, බණ්ඩාරගම.

ලේකම්, පානදුර ප්‍රාදේශීය සභාව, වාද්දුව.

ලේකම්, ප්‍රාදේශීය සභාව, කළුතර.

**බොල්ගොඩ ජලාශය ආශ්‍රිත පෝෂක ප්‍රදේශ සඳහා**

**[illegible] ක්‍රියාත්මක කිරීම**

---

ඉහත කරුණ සම්බන්ධව මගේ සමාංක හා 2002.08.07 දින ඔබ වෙත එවනු ලැබූ ලිපියට වැඩිමනත්වයි.

යථෝක්ත ලිපියේ 3 වන ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු අතර, ඒ පිළිබඳ අයදුම්පත් මෙ අධිකාරියේ අධ්‍යක්ෂ (බලාත්මක) වෙත යොමු කර අදාළ නිර්දේශය ලබාගන්නා ලෙස මින් දන්වා සිටිමි.

3.1 හෙක්ටයාර් එකට වැඩි ඉඩම් අනුබෙදීම් කිරීම සඳහා වන අයදුම්පත්

3.2 සියළුම කර්මාන්ත සඳහා වන අයදුම්පත්

3.3 කුඹුරු හා පහත් බිම් සංවර්ධනය කිරීම සඳහා වන අයදුම්පත්

3.4 සංචාරක ව්‍යාපාරවලට අදාළ සියලු අයදුම්පත්

3.5 පස් කැපීම සඳහා වන සියළු අයදුම්පත්

ජේ.එම්.එල්.ජයසේකර
අධ්‍යක්ෂ ජනරාල්
නාගරික සංවර්ධන අධිකාරිය